සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** **නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**සැලකිය යුතුයි :**

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. ඕනෑම් වෘත්තයක විශ්කම්භය මිනුමක් ලෙස ගෙන ඒම වෘත්තයේ පරිධිය වටා කවකටුවෙන් සලකුණු කරගෙන යාමේ දී ලැබෙන කොටස් ප්‍රමාණය වන්නේ,

(i) 03 කි. (ii) 06 කි. (iii) 04 කි. (iv) 08 කි.

02. 


කාර්මික චිත්‍ර ඇඳීමේ දී ප්‍රක්ෂේපණ ක්‍රමයක ආරම්භක අවස්ථාවක් රූපයේ දැක්වේ. මෙම ක්‍රමය හඳුන්වන්නේ,

(i) ඍජු ප්‍රක්ෂේපණ ක්‍රමය ලෙස ය. (ii) සමාංශක ප්‍රක්ෂේපණ ක්‍රමය ලෙස ය.
(iii) හරස් ප්‍රක්ෂේපණ ක්‍රමය ලෙස ය. (iv) පර්යාලෝක ප්‍රක්ෂේපණ ක්‍රමය ලෙස ය.

03. ඇඳීමේ පුවරුවක් හා ටී රූලක් භාවිතා කරනුයේ,

(i) නිවැරදිව ලිවීමට ය. (ii) පරිපථ සවිකිරීමට ය.
(iii) කාර්ය චිත්‍ර ඇඳීමට ය. (iv) ඉහත සියල්ලටම ය.

04. බහු අස්‍ර සඳහා උදාහරණයක් නොවන්නේ පහත රූප අතුරින් කවරක්ද?

(i)  (ii)  (iii)  (iv) 

05. කාර්මික ඇඳීම යනු,

(i) ප්‍රස්ථාරික භාෂාවකි. (ii) විශ්ව භාෂාවකි.
(iii) නිතිපතා වැඩිවන අගයකින් යුතු භාෂාවකි. (iv) ඉහත සියල්ලම ය.

06. නිර්මාණයක් ඇඳීමේ දී එහි පෙනෙන දාර දැක්වීම සඳහා භාවිතාකරන රේඛාවර්ගය වන්නේ,

(i) සිහින් අඛණ්ඩ රේඛා ය. (ii) ඝන අඛණ්ඩ රේඛා ය.
(iii) සිහින් දාම රේඛා ය. (iv) කඩ රේඛා ය

07. මෙම රූපය මගින් පෙන්නුම් කරනුයේ,

(i) සමාන වෘත්ත දෙකකට පොදු භාහිර ස්පර්ශයක් ඇඳීම ය.
(ii) සමාන වෘත්ත දෙකකට පොදු තීර්යක් ස්පර්ශයක් ඇඳීම ය.
(iii) සමාන වෘත්ත දෙකකට පොදු ස්පර්ශයක් ඇඳීම ය.
(iv) සමාන වෘත්තදෙකකට භාහිර ලක්ෂ්‍යක සිට ස්පර්ශකයක් ඇඳීම ය.



08. කාර්මික ඇඳීම මගින් ප්‍රකාශ නොවන්නකි,

(i) හැඩය (ii) ප්‍රමාණය (iii) පිහිටීම (iv) මිල

09. නිවැරදි පිරිවිතර අනුව ආවුද හා උපකරණ තෝරා ගැනීමෙන් ලැබෙන වාසි අතරට අයත් නොවන්නේ,

(i) කාර්ය වඩාත් පහසු වීම.

(ii) කාලය ඉතිරි වීම.

(iii) උසස් ප්‍රමිතියෙන් යුත් නිමවුමක් ලබා ගැනීමට නොහැකිවීම.

(iv) අනතුරු වැළැකීම.



10. මෙම රූප සටහන ඇඳී ඇත්තේ,

(i) සමාංශක ප්‍රක්ෂේපණයක් ක්‍රමයෙනි. (ii) නිදහස් අතිනි.

(iii) ඍජු ප්‍රක්ෂේපණ ක්‍රමයෙනි. (iv) තෙවන කෝණ ක්‍රමයෙනි.

11. දැවයෙන් සාදන ලද භාණ්ඩයක කොටස් දෙකක් ඍජුකෝණීව එකලස් කිරීමෙන් අනතුරුව එහි ඍජුකෝණී බව නිවැරදි දැයි පරීක්ෂා කිරීමට,

(i) මුළු මට්ටම ගනී. (ii) සුවාය වට්ටම ගනී.

(iii) කෝණමානය ගනී. (iv) දුනු බෙදුම් කටුව ගනී.

12. අත් කියතක් මුවහත් කිරීමට භාවිත කරන්නේ,

(i) රවුම් පීර (ii) පැතලි පීර (iii) තුන් හුලස් පීර (iv) සියල්ලම

13. ආවුද උපකරණ අස්ථානගත වීම වලක්වා ගැනීමටත්, පහසුවෙන් අවශ්‍ය අවස්ථාවල ඒවා ලබාගැනීමටත් භාවිතයට ගතහැකි ක්‍රමය වන්නේ එම ආවුද උපකරණ,

(i) පෙට්ටියක ඇසිරීම ය. (ii) අල්මාරියක ඇසිරීම ය.

(iii) සෙවනැලි පුවරුවක ඇසිරීමය. (iv) ඉහත සියල්ලම නිවැරදි ය.

14. අත් කියතක් මුවහත් කිරීමට අනුගමනය කළහැකි ප්‍රධාන පියවර,

(i) 4 කි. (ii) 3 කි. (iii) 6 කි. (iv) 2 කි.

15. අවශ්‍යතාවය අනුව දැව කොටස්වල විවිධ කෝණ ඇඳගැනීමේ හැකියාව පවතින උපකරණය වන්නේ මින් කුමක්ද?

(i) වරක්කලය (ii) ස්වාය වට්ටම් ලෑල්ල (iii) මුළු මට්ටම (iv) මිනුම් පටිය

16. ආවුද හා උපකරණ නිෂ්පාදකයන් විසින් නිර්දේශ කර ඇති උපදෙස් පිළිපැදීම මගින්,

(i) පුද්ගල ආරක්ෂාව සැලැසේ. (ii) ආවුද උපකරණවල ආරක්ෂාව සැලැසේ.

(iii) නිපැයුම්වලට ආරක්ෂාව සැලසේ. (iv) ඉහත සියල්ලම

17. විනිවිද පෙනෙන සිහින් නම්‍යශීලී ප්ලාස්ටික් බටයක ජලය පුරවා සකස් කර ගන්නා ආදේශක මිනුම් උපකරණය වන්නේ,

(i) ලෙවෙල්බටය (Level Tube) (ii) ලෙවලය (Sprit Level)

(iii) තියොඩොලයිට්ටුව (Theodotlite) (iv) ලඹය (Plumb bob)

18. අනතුරු ඇතවීමට බලපාන සාධකයක් නොවන්නේ,

(i) විදුලි කාන්දුව (ii) සැලකිලිමත්බව හා පිළිවෙල.

(iii) නොදැනුවත්කම (iv) යාන්ත්‍රිකදෝෂ

19. මුවහත් කිරීමේ ආවුද උපකරණ කාණ්ඩයට අයත් නොවන්නකි.

(i) පීරි වර්ග (ii) ගිනිගල් යන්ත්‍රය (iii) තෙල්බඳුන (iv) රාස්පය

20. ද්‍රව්‍යවල පවත්නා ගුණ ප්‍රධාන වශයෙන් වර්ග කිරීමේ දී ආතතිය, හංගුරතාවය හා නම්‍යතාවය ආදී ගුණ අයත් වන්නේ,

(i) විද්‍යුත් ගුණවලට ය. (ii) භෞතික ගුණවලට ය.

(iii) යාන්ත්‍රික ගුණවලට ය. (iv) රසායනික ගුණවලට ය.

21. කොන්ක්‍රීට් වැරගැන්වීම සඳහා යොදගත නොහැකි කම්බි විශේෂය වන්නේ,

(i) දඟර වානේ කම්බි (ii) නාරටි වානේ කම්බි (iii) මෘදු වානේ කම්බි (iv) බඳින කම්බි

22. රූපයේ පිළිවෙලින් A, B හා C වනුයේ,

(i) ඇණ කට්ටය, ඇණ කඳ, ඇණ හිස

(ii) ඇණ හිස, ඇණ කට්ටය, ඇණ කඳ

(iii) ඇණ කඳ, ඇණ හිස, ඇණ කට්ටය

(iv) ඇණ හිස, ඇණ කඳ, ඇණ කට්ටය




23. සවිකුරු සකස්කර ගැනීම සඳහා,

(i) වානේ යොදාගනී. (ii) තඹ යොදාගනී.

(iii) පිත්තල යොදාගනී. (iv) ඉහත සියල්ල ම යොදාගනී.

24. දකුණු පස රූපයෙන් දක්වා ඇති ආවුදය වන්නේ,

(i) බුරුම කටුවයි.

(ii) අවගාරයකි.

(iii) අලිස්කටුවකි.

(iv) රැචට් බුරුව කටුවකි.



25. අලංකාර නිමාක් අපේක්ෂාකරන වැඩවලට යොදා ගන්නා පිත්තල හා මෘදු වානේ ලෝහවලින් නිපදවා ඇති ඇණ වර්ගය වනනේ,

(i) පනෙල් ඇණ (ii) ටින්ඩ්ටැක්ස් ඇණ

(iii) ගිම්පි ඇණ (iv) බෝට්ටු ඇණ

26. ඉරි තැලීම් හා ඇඳ ගැසීම් සහිත ලා දම් පැහැයට ආසන්න වර්ණයෙන් යුතු ගඩොල් දෝෂය වන්නේ,

(i) ආස්තරික සහිත ගඩොල් (ii) ඇඹරුණු ගඩොල්

(iii) වැඩියෙන් පිළිස්සුණු ගඩොල් (iv) අඩුවෙන් පිළිස්සුණු ගඩොල්

27. ස්නේහනය මගින් යන්ත්‍ර කොටස්වල,

(i) ක්‍රියාකාරීත්වය සුමට වේ. (ii) උපාංග ගෙවීම අවම වේ.

(iii) පහසුවෙන් කරකැවීම සිදු වේ. (iv) ඉහත සියල්ලම සිදු වේ.

28. ඉස්කුරුප්පු ඇණ භාවිතයේ ඇති වාසියකි.

(i) සවිකරණ ලද කොටස් හානියකින් තොරව නැවත ගලවාගත හැකිවීම.

(ii) ඉතා හොඳින් කොටස් එකලස් නොවීම.

(iii) මෙම ඇණ සවිකිරීම ට මිටිය භාවිතා කළ හැකි වීම.

(iv) මෙම ඇණ සවිකිරීමට අඬුව භාවිත කළ හැකි වීම.

29. දොර ජනෙල් සවිකිරීම සඳහා විශේෂයෙන් යොදන සරනේරු වර්ගයකි.

(i) පෙට්ටි සරනේරු (ii) පටි සරනේරු

(iii) චවුල් සරනේරු (iv) ප්‍රතිවර්තිත පටි සරනේරු

30. ආවුද උපකරණ වර්ග කිරීමේදී වඩාත් සුදුසු ම ක්‍රමය වන්නේ ආවුද උපකරණවල,

(i) හැඩය අනුව වර්ග කිරීමයි. (ii) මිල අනුව වර්ග කිරීමයි.

(iii) භාවිතය අනුව වර්ග කිරීමයි. (iv) සුලභතාවය අනුව වර්ග කිරීමයි.

31. කොන්ක්‍රීට් වැඩවලදී භාවිතාකරණ හැඩයම් සඳහා යොදාගන්නා දැව වර්ගයකි.

(i) තේක්ක (ii) කොට්ට (iii) නැදුන් (iv) බුරුත

32. පහත සඳහන් ආවුද උපකරණ අතුරින් භාවිතයෙන් ඉවත්වෙමින් පවතින්නක් වන්නේ,

(i) තොරපනය (ii) අත්කියත (iii) අඬු මිටිය (iv) අතකොළුව

33. වැලි, සිමෙන්ති, කළුගල් කැබලි (Metal) පිළිවෙලින් මෙම විෂය තුළ හඳුන්වන්නේ,

(i) රළු සමාහාර, බැදුම් ද්‍රව්‍ය, සියුම් සමාහාර ලෙස ය.

(ii) බැදුම් ද්‍රව්‍ය, රළු සමාහාර, සියුම් සමාහාර ලෙස ය.

(iii) සියුම් සමාහාර, බැදුම් ද්‍රව්‍ය, රළු සමාහාර ලෙස ය.

(iv) බැදුම් ද්‍රව්‍ය, සියුම් සමාහාර, රළු සමාහාර ලෙස ය.

34. දැව කඳක මේරූ වැඩට ගත හැකි කොටස හඳුන්වන්නේ,

(i) අරටුව (ii) එලය (iii) හරඬුව (iv) කඳ කොටස

35. කෘත්‍රිම දැව වලට අයත් නොවන්නේ,

(i) චිප්බෝඩ් (Chip Board) (ii) තුනී ලෑලි (Flywood)

(iii) හාර්ඩ් බෝඩ් (Hard Board) (iv) ක්ලැඩින් බෝඩ් (Cladding Board)

36. ගෙබිම ඇතිරීමට යොදන තනි කොන්ක්‍රීටයක මිශ්‍රන අනුපාතය වන්නේ,

(i) 1: 3: 6 (40) (ii) 1: 2: 4 (20) (iii) 1: 1½: 3 (12) (iv) 1: 1: 2 (20)

37. මෙම රූපයෙන් දක්වා ඇත්තේ,



(i) ගඩොල් වරියකි.

(ii) ඔළු ගල් වරියකි.

(iii) බඩගල් බැම්මකි.

(iv) ඔළුගල් හා බඩගල් බැම්මකි.

38. කොන්ක්‍රීට් පිළිබඳ වැරදි ප්‍රකාශයකි.

(i) ශක්තිමත්බව (ii) සම්පීඩන ශක්තිය ඉතා අඩුවීම.

(iii) කල්පවතී. (iv) අවශ්‍ය හැඩය වාත්තුකළ හැකි වීම.

39. දැව කැබැල්ලක් වැඩ බංකුවට තබා හිර කර අල්ලා ගැනීමට භාවිත කළ හැක්කේ,

(i) "T" කරාමය මගිනි. (ii) බැංකු දඬු අඬුව මගිනි.

(iii) අත් අඬුව මගිනි. (iv) මැද්දුම් කරාමය මගිනි.

40. බහුකාර්යය ලී වැඩ යන්ත්‍රයක් සිදුකරගත නොහැකි කාර්යයකි,

(i) සිදුරු වීදීම (ii) දැව යතු ගා ගැනීම. (iii) දැව කැපීම. (iv) දැව මූට්ටු කිරීම.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** **නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - II** කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතු ඃ-

- පළමුවන ප්‍රශ්නය සහ තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්ණ පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්ණයට ලකුණු 20 ක් ද තෝරා ගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01. i. විෂ්කම්භය 7 cm වූ වෘත්තයක් තුළ සවිධි සන්නාස්‍රයක් නිර්මාණය කරන්න.

    ii. විෂ්කම්භය 8 cm වූ වෘත්තයක් සරල දාරය, පැන්සල හා කවකටුව පමණක් භාවිතා කර සමාන කොටස් 12 ට බෙදා දක්වන්න.

02. "ඉදිකිරීම් ක්ෂේත්‍රයේදී බහුලව භාවිතා කරනු ලබන ද්‍රව්‍යයක් ලෙස කොන්ක්‍රීට් දැකිය හැක."

    (i) කොන්ක්‍රීට් මිශ්‍රණයක අඩංගු වන ද්‍රව්‍ය මොනවාද?

    (ii) ඉහළ ප්‍රමිතියෙන් යුත් කොන්ක්‍රීට් නිපයුමක් සකස් කර ගැනීමට සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

    (iii) කොන්ක්‍රීට් පදම් කිරීම යනුවෙන් අදහස්කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

    (iv) බැහුම් පරීක්ෂාව සිදුකරනු ලබන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

03. (i) පිරිවිතර යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

    (ii) පිරිවිතර ලෙස සැලකිල්ලට ගනු ලබන නිර්නායක 3 ක් ලියන්න.

    (iii) ඔබ යම් කාර්යයකදී පිරිවිතරවලට අනුව ආවුද හා උපකරණ තෝරාගැනීමෙන් ලැබෙන වාසි 04 ක් ලියන්න.

04. "ආවුද හා උපකරණ භාවිතයේදී ඒවායේ නඩත්තුව ගැන සැලකිලිමත් වීම වැදගත් කාරණයකි."

    (i) ආවුද හා උපකරණ භාවිතයෙන් අනතුරුව ඒවා පිළිබඳ සැලකිලිමත් විය යුත්තේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.

    (ii) සෙවනැලි පුවරුවක ආවුද හා උපකරණ ගබඩාකිරීමෙන් ලැබෙන වාසි තුනක් ලියන්න.

    (iii) ආවුද හා උපකරණ යනුවෙන් කුමක් අදහස් වන්නේ දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

    (iv) භාවිතයෙන් ඉවත්ව යන ආවුද හා උපකරණ 03 ක් නම් කරන්න.

05. "කොටස් එකලස් කිරීමේදී සුදුසු සවිකුරු භාවිතය මගින් උසස් නිමවුමක් හා මනා සබඳතාවක් ඇතිකළ හැක."

(i) සවිකුරු යොදාගන්නා අවස්ථා 03 ක් ලියන්න.

(ii) ඔබ දන්නා ඉස්කුරුප්පු ඇණ වර්ග 03 ක් නම් කරන්න.

(iii) දැව කර්මාන්තයේදී කම්බි ඇණ භාවිතයට වඩා ඉස්කුරුප්පු ඇණ භාවිතයේ ඇති වාසි මොනවාද?

(iv) ඉස්කුරුප්පු ඇණයක කොටස් පහත රූපයේ දක්වා ඇත. ඒවා හඳුනාගෙන නම් කරන්න.




06. "යම්කිසි කාරියක් කිරීමේදී ආරක්ෂවට ප්‍රථම ස්ථානය ලබාදිය යුතුය."

(i) අනතුරු ඇතිවීමට බලපාන සාධක 03 ක් නම් කරන්න.

(ii) ආරක්ෂක පුර්වෝපා යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

(iii) කාර්යයක් කිරීමේදී ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(iv) යන්ත්‍ර භාවිතයේදී අනතුරු ඇතිවීමට බලපෑ හැකි සාධක 03 ක් ලියන්න.

07. "භාවිතයට ගනු ලබන දැව වල ඇති දැව දෝශ කලින් හඳුනා ගැනීමෙන් හානි අවම කර ගත හැක."

(i) දැවවල ඇතිවන දෝෂ තුනක් නම් කරන්න.

(ii) පහත සඳහන් දෝෂය හඳුනාගෙන එය ඇතිවීමට බලපාන හේතුවක් සඳහන් කරන්න.



(iii) දැව පදම් කිරීම යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(iv) දැව පදම් කිරීමේ ප්‍රධාන ක්‍රම තුනක් ඇත. ඒවා නම් කරන්න.

## I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( i ) | 02. (ii ) | 03. (iii) | 04. (iii) | 05. (iv) | 06. (ii ) | 07. ( i ) | 08. (iv) | 09. (iii) | 10. ( ii) |
| 11. ( i) | 12. (iii) | 13. (iii) | 14. ( i ) | 15. (ii ) | 16. (iv) | 17. ( i ) | 18. (ii ) | 19. (iv) | 20. (iii) |
| 21. (iv) | 22. (ii ) | 23. (iv) | 24. (ii ) | 25. ( i ) | 26. (iii) | 27. (iv) | 28. ( i ) | 29. (iii) | 30. (iii) |
| 31. (ii) | 32. ( i ) | 33. (iii) | 34. ( i ) | 35. (iv) | 36. ( i ) | 37. (iii) | 38. (ii ) | 39. (ii) | 40. (iv) |

## II පත්‍රය

01.




| | | |
|---|---|---|
| 01. | නියමිත මිනුම්වලට වෘත්තය ඇඳීම | 01 |
| 02. | AB රේඛාව (විෂ්කම්භය) ඇඳීම | 01 |
| 03. | AC රේඛාව ඇඳීම | 01 |
| 04. | B. 7 යා කිරීම | 01 |
| 05. | A. C රේඛාව සමාන කොටස් 7 ට බෙදීම | 02 |
| 06. | D. ලක්ෂ්‍යය ලබා ගැනීම | 01 |
| 07. | E. ලක්ෂ්‍යය ලබා ගැනීම | 01 |
| 08. | D. E යාකර ෆ ලබා ගැනීම | 01 |
| 09. | AF දුර කවකටුවම ගෙන පරිධිය ලකුණු කිරීම | 01 |
| 10. | ලකුණු කළ ලක්ෂ යා කර සප්තාස්‍රය ඇඳීම | 02 |
| 11. | නිවැරදි මිනුම් වලට ඇඳීම | 01 |
| 12. | පිරිසිදු භාවය | 01 |
| 13. | නිවැරදි අක්ෂර හා ඉලක්කම් භාවිතය | 01 |
| | මුළු ලකුණු | 10 |



| | | |
|---|---|---|
| 01. | වෘත්තය ඇඳීම | 01 |
| 02. | වෘත්තය සමාන කොටස් බෙදීම | 01 |
| 03. | සමඡේද කිරීම | 01 |
| 04. | කොටස් 12 ට බෙදීම | 01 |
| 05. | නිවැරදි මිනුම් | 01 |
| | මුළු ලකුණු | 05 |

$$\frac{15}{15} + \frac{5}{5} = \boxed{\frac{20}{20}}$$

## පිළිතුරු - ඉතිරි කොටස

02. (i) සියුම් සමාහාර, රජ සමාහාර, බැඳුම් ද්‍රව්‍ය (සිමෙන්ති) ජලය ල. 02

(ii) සමාහාර වල අමිතිය, කොන්ක්‍රීට් මිශ්‍රණ අනුපාතය, ජලය එකතු කරන ප්‍රමාණය, වැ ගැන්නුම් කම්බි අනුපාතය, සුසංහසනය කිරීම, කොන්ක්‍රීට් පදම් කිරීම ගැන සැලකිලිමත් විය යුතුය. කරුණු 2 ල. 02

(iii) කොන්ක්‍රීට් තැන්පත්කර සුසංහසනය කිරීමෙන් අනතුරුව කොන්ක්‍රීට් සවිවන තුරු මතුපිට තෙතමනය රඳවා තබා ගැනීමයි. ල. 03

(iv) බැහුම් පරීක්ෂාව සිදුකරන ආකාරය නිවැරදිව දැක්වීමට ල. 03

03. (i) යම් දෙයක් සුවිශේෂ කර දැක්වීමට, නිවැරදිව හඳුනාගැනීමට, යොදා ගැනෙන ලක්ෂණ පිරිවිතර ලෙස හඳුන්වයි. නිවැරදි පිළිතුරට ල. 03

(ii) දිග, නිෂ්පාදිත ද්‍රව්‍ය, බර, හැඩය, නිමාව, කාරියක්ෂමතාවය  යනාදිය වේ. ල. 03

(iii) කාර්යය නිවැරදිව කල හැකි වීම.
කාර්යය වඩාත් පහසු වීම.
කාලය ඉතිරි වීම.
අලංකාර උසස් නිමාවක් ලබාගැනීමට හැකි වීම.
අනතුරු වැළැකීම.
උසස් ප්‍රමිතියෙන් යුතු නිමවුමක් ලැබීම කරුණු 04 ල. 02

04. (i) භාවිතයේ දී හා භාවිතයෙන් පසුව පිරිසිදු කිරීම.
මොට වූ කොටස් යථා තත්ත්වයට සකස් කිරීම.
ගෙවුන කොටස් සඳහා අළුත් කොටස් යෙදීම.
නියමිත ස්ථානවල ගබඩා කිරීම. කරුණු 02 ල. 02

(ii) උකරණ අස්ථානගත වීම වැලකීම.
හොඳින් දර්ශනය වීම.
උපකරණ වලට හානි නොවීම.
පහසුවෙන් ලබාගත හැකි වීම.
කාලය ඉතිරි වීම. කරුණු 03 ල. 03

(iii) කැපීම, සෑහීම, විදීමට භාවිතා කරනුයේ ආවුද වේ. උදාඃ- නියන්, කියත ආදිය.
කැපීමක් සිදුනොවන කාර්යයන් කර ගැනීමට යොදා ගනු ලබන අනෙකුත් දේ උපකරණ වේ.
උදාඃ- මිටිය, ලඹය, ලෙවලය ල. 02

(iv) අවගාරය, දුනු කියත, රැචට් බුරුමය, තට්ටු යත්ත, තහඩු කියත කරුණු 03 ල. 03

05. (i) දැව කොටස් සම්බන්ධ කිරීමේදී
දොර පියන් සවි කිරීමේදී
දොර යතුරු දැමීමට සවි කිරීමේදී
ජනෙල සුළඟට එහා මෙහා යෑම වැළැක්වීමට කටයුතු කිරීමේදී ල. 03

## පිළිතුරු - ඉතිරි කොටස

(ii) රවුම් හිස සහිත ඉස්කුරුප්පු ඇණ.
රවුම් හිස සහිත පිලිෆ්ස් ඉස්කුරුප්පු ඇණ
පැතලි සපරම් හිස සහිත ඉ. ඇණ.
පැතලි සපරම් සහිත පිලිෆ්ස් ඉ. ඇණ
අභ්‍යන්තර හිස සහිත ඉ. ඇණ ල. 03

(iii) දැව කොටස් ශක්තිමත්ව හිරවී පැවතීම.
(ඇණයේ ඇති ටේපර් ආකාරය නිසා සන්ධිවීම හොඳින් සිදු වේ.)
හානියකින් තොරව නැවත ගලවා සවිකල හැක.
අලුත් වැඩිය කටයුතු පහසු වීම. කරුණු 02 ල. 02

(iv) A - ඇණ කට්ටය
B - ඇණ හිස
C - ඇණ කඳ
D - ඇණ පොට ½x4 ල. 02

06. (i) පරිසරයේ සෝෂාකාරී බව, යාන්ත්‍රික දෝෂ, නොසැලකිලිමත් බව, ගින්න, විදුලිය කාන්දුවීම, ආලෝක කිරණ, රසායන ද්‍රව්‍ය, නොදැනුවත්කම කරුණු 03 ල. 03

(ii) අනතුරක් වීමට ප්‍රථම ආරක්ෂාව සම්බන්ධයෙන් සැලකිලිමත්ව කටයුතු කිරීමය. ල. 02

(iii) දෝෂ සහිත උපකරණ භාවිතා නොකිරීම.
අනතුරු ඇතිවනසේ උපකරණ පරිහරණය නොකිරීම.
වැඩකරන්න ඉඩ ඇතිව සිටීම
හොඳින් ආලෝකය හා වාතය ඇතිව වැඩ කිරීම. ල. 02

(iv) නිෂ්පාදකයින් ලබා දී ඇති උපදෙස් පිළිනොපැදීම.
පිරිවිතරුවලට අනුව ආවුද උපකරණ තෝරා නොගැනීම.
කැරකෙන කොටස්වල ආරක්ෂිත කොටස් ගලවා දැමීම.
ආරක්ෂිත ඇඳුම් පැළඳුම් නොපැලදීම වැනි නිවැරදි කරුණු 03 ට ල. 03

07. (i) කොස්ස, ඇටවුම, පලුද්ද, ගැටය, දිරුම, ඇඹරුම, එළය, ඉරිමදය, හරඩුව, මිලියම්නහර කරුණු 03 ල. 03

(ii) තරු පලුද්ද, දැවකදන් කපා දමා හිරු එළියට නිරාවරණය වීමෙන් ඉරි මදයේ තරුවක ආකාරයට අ පළුවකි.
ල. 02

(iii) දැවයේ අඩංගු තෙතමනය ක්‍රමාණුකූලව අඩුකර පරිසරයේ ආර්ද්‍රතාවයට සමාන කිරීමයි. ල. 02

(iv) ස්වභාවික පදම් කිරීම හෙවත් පවන් පදම් කිරීම
පොරණුවේ පදම් කිරීම හෙවත්කෘතිමව පදම් කිරීම
මිශ්‍ර පදම් කිරීම හෙවත් පවනේ හා පොරණුවේ පදම් කිරීම.